# යෝගාර්ණවයෙහි අන්තර්ගත ස්ත්‍රී රෝග චිකිත්සාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

දිසානායක එස්. ඒ., පුෂ්පකුමාරි ඩබ්. එල්. ඒ. ආර්.
කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයනාංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

**සංක්ෂිප්තය**

මයුරපාද පරිවේණාධිපති ව වැඩවිසූ බුද්ධපුත්‍ර හිමියන් විසින් රචිත සේ සැලකෙන යෝගාර්ණවයට දේශීය වෛද්‍ය ග්‍රන්ථ අතරින් හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මෙම ග්‍රන්ථයෙහි විවිධ රෝග සඳහා චිකිත්සාව දක්වා ඇති අතර එහි 41 වන අධ්‍යාය ස්ත්‍රී චිකිත්සා නම් වේ. දේශීය වෛද්‍ය කර්මය තුළ අන්තර්ගත ස්ත්‍රී රෝග චිකිත්සාව පිළිබඳ ව යෝගාර්ණවය උපයෝගී කරගෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙම පර්යේෂණය සඳහා පණ්ඩිත කිරිඇල්ලේ ඥානවිමල ස්වාමීන් වහන්සේ විසින් සංස්කරණය කරණ ලද යෝගාර්ණවය භාවිත කරන ලදී. 41 වන අධ්‍යාය තුළ අන්තර්ගත රෝග සහ එහි චිකිත්සාව පිළිබඳ සියලු ම කරුණු විශ්ලේෂණය කර එම චිකිත්සාවන්හි විද්‍යාමාන වන සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්නා ලදී. එම කරුණු අනුව යෝගාර්ණවය ස්ත්‍රී රෝග ප්‍රභේදකරණයට ලක් කර ඇත්තේ වාතජ, පිත්තජ, කඵජ, ක්‍රිමිජ සහ ව්‍යාපී යනුවෙනි. මෙම එක් එක් ප්‍රභේදයන් සඳහා රෝග ලක්ෂණයන් සහ පොදු චිකිත්සා විධි පළමු ව ද අනතුරු ව එක් එක් රෝග සඳහා වෙන් වෙන් වශයෙන් ද චිකිත්සාව දක්වා ඇත. ස්ත්‍රී රෝග සඳහා පමණක් නොව ගර්භිණී, ප්‍රසව සහ සූතිකා රෝග සඳහා ද චිකිත්සාව මෙම අධ්‍යාය තුළ ම විස්තර වේ. උද්භිද ඖෂධ, පාර්ථිව ඖෂධ මෙන් ම ජාන්තව ඖෂධ ද චිකිත්සා කර්මය සඳහා උපයෝගී කරගෙන ඇති අතර අභ්‍යන්තර ප්‍රතිකාර මෙන් ම බාහිර ප්‍රතිකාර ද එකසේ නිර්දේශ කර ඇත. ඖෂධ සංස්කරණ වශයෙන් ස්වරස, කෂාය, කල්ක, තෛල, පැණි සහ භෂ්ම මෙන් ම චිකිත්සාව සඳහා ආහාර සංස්කරණ බහුල ව යෙදීම සුවිශේෂී ලක්ෂණයකි. බාහිර ප්‍රතිකාර ක්‍රම මෙහි පුළුල් පරාසයක භාවිත වන අතර ආලේප, ශෝධන, ධූපන, පූරණ, ශේක, අවගාහ ආදි ස්ථානික කර්ම ද නස්‍ය, පූඩාවන් යෙදීම ආදි විශේෂ ප්‍රතිකාර ද නිර්දේශ කර තිබේ. යෝගාර්ණවයෙහි දක්වා ඇති ස්ත්‍රී රෝග චිකිත්සාවෙහි වෙනත් සුවිශේෂ ලක්ෂණ ලෙස ඖෂධ සංස්කරණයේ දී සහ ඖෂධ නිර්දේශ කිරීමේ දී මාන භාවිතය, අනුපාන භාවිතය සහ කෙම් ක්‍රම භාවිතය දැක්විය හැක. මෙම සියලු කරුණු අනුව පැහැදිලි වන්නේ දේශීය වෛද්‍ය ක්‍රමය සතු ව එයට ආවේණික වූ ද පුළුල් පරාසයක විහිදුනා වූ ද ප්‍රායෝගික වූ ද අංගසම්පූර්ණ වූ ද ස්ත්‍රී රෝග චිකිත්සා පද්ධතියක් පැවතුණ බව යි.

**ප්‍රමුඛ පද:** යෝගාර්ණවය, ස්ත්‍රී රෝග, චිකිත්සාව

**විද්‍යුත් ලිපිනය:** achini85surandi@gmail.com